**පිවිතුරු බලශක්ති හා ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2016**

**-----------------------------------------------------------------------**

පිවිතුරු බලශක්ති හා ප්‍රවේශයන් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 ජුනි 17 දින එළඹි අංක 2518 සහ අංක 2519 (එස් ආර් අයි) (එස් එෆ්) දරන ණය ගිවිසුම්වල හා අංක 0149- එස් ආර් අයි දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**-----------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ ණය සහ ප්‍රදාන ගිවිසුම් අනුව, විදුලි බල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලි බල මණ්ඩලය හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ (අ) වඩා ශක්තිමත් සම්ප්‍රේෂණයක් හා බෙදාහැරීම් ජාලයක් සහ මහනගර සහා වීථි ආලෝකකරණය පිළිබඳ ඉල්ලුම් කළමනාකරණය (ආ) කුඩා ජල විදුලිබල පිරියත සඳහා ජාල අවහිරතා ඉවත් කිරීම සහ (ඇ) නැගෙනහිර පළාතේ වඩා ශක්තිමත් සම්ප්‍රේෂණ ජාලය හා තෝරාගත් පළාත්වල සේවා සම්බන්ධතා සඳහා පුළුල් කරන ලද ණය සහාය වැඩ සටහනක් මඟින් ලංකා විදුලි බල මණ්ඩලයේ හා සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ආවරණ ප්‍රදේශය හා සේවා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීමෙන් දැරිය හැකි හා විශ්වාසදායී විදුලි බල සැපයුම සාක්ෂාත් කර ගැනීමයි. ව්‍යාපෘති පරිපාලන ලියවිල්ල ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 20,274.80 කට සමාන එජඩො මිලියන 188.20 ක් වන අතර ඉන් රු.මිලියන 17,689.20 කට සමාන එජඩො මිලියන 164.20 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2010 පෙබරවාරි 09 දින ආරම්භ කරන ලද අතර 2013 මැයි 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 අගෝස්තු 20 දක්වා හා 2016 දෙසැම්බර් 31 දක්වා පිළිවෙලින් දීර්ඝ කර තිබුණි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**-------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ

විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන ,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද යාවත්කාලීන කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය සහ ප්‍රදානවලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය සහ ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඊ) ණය සහ ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

---------------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැර මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය සහ ප්‍රදාන ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-------------------------------------------

**2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

--------------------------------

2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/2 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛය අනුව, 2017 මාර්තු 31 දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2017 ඔක්තෝබර් 30 දින දීය.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් ග්‍රාමීය නිවාස සම්බන්ධතා පහසුකම් යටතේ ලබාදෙන ලද සහනදායී ණය මත 2016 දෙසැම්බර් 31 දිනට විදුලි පාරිභෝගිකයන්ගෙන් අයකරන ලද රු.මිලියන 49.82 ක් වූ පොලී, නිවාස සම්බන්ධතා චක්‍රීය අරමුදලට බැර කරනු වෙනුවට ලංකා විදුලිබල මණ්ඩලයට කරන ලද ප්‍රදාන ලෙස දක්වා තිබුණි.

(ආ) වටිනාකම රු.මිලියන 3,135.21 කට නිම කර ලංකා විදුලිබල මණ්ඩලයට පවරන ලද වැඩ හා රු.මිලියන 331.97 කට අදාළ කොන්ත්‍රාත්කරුවන්ගෙන් පවරාගත් මෝටර් වාහන ව්‍යාපෘතියේ වත්කම් ලෙස අඛණ්ඩව දක්වා තිබුණි.

### 2.2.3 නොසැසඳු වෙනස්කම්

විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය තුළ වියපැහැදම් කරන ලද මුදල රු.මිලියන 1,459.80 ක් වූ අතර එය සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.මිලියන 1,482.67 ක් වූ අනුරූපී මුදල සමඟ එකඟ වී නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය/ප්‍රදාන ගිවිසුම්වල මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ ස බැ | 164.20 | 17,689.20 | 2,802.00 | 9.91 | 1,482.70 | 120.40 | 18,001.60 |
| ශ්‍රී ලං ර | 24.00 | 2,585.60 | - | - | - | - | - |
| ලංවිම | - | - | 218.00 | 4.45 | 665.20 | 19.30 | 2,880.30 |
| එකතුව | 188.20 | 20,274.80 | 3,020.00 | 14.36 | 2,147.90 | 139.70 | 20,881.90 |

ලැබුණු තොරතුරු අනුව, රු.මිලියන 17,689 කට සමාන එජඩො මිලියන 164.29ක් වූ වෙන්කිරීමෙන් සියයට 73 ක් නියෝජනය වන රු.මිලියන 18,001.60 කට සමාන එජඩො මිලියන 120.40 ක් පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදය අවසානයට උපයෝජනය කර තිබුණි. තවද, ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට ණය නියෝජිතායතනය විසින් රු.මිලියන 6.33 ක බැඳීම් ගාස්තු අයකර තිබුණි.

**3.2 භෞතික ප්‍රගතිය**

**-------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම, පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා දිළිඳු පුද්ගලයන් සඳහා ප්‍රවේශය යන සංරචක 03 යටතේ ව්‍යාපෘතියේ කටයුතු කොටස් 08 කින් සමන්විත වන අතර, ඉන් කොටස් 06 ක් 2015 දෙසැම්බර් 31 වන විටත් නිම කර තිබුණි. බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සංරචකයේ 01 කොටස යටතේ ජාතික පද්ධති පාලන මධ්‍යස්ථානයේ ඉදිකිරීම් වැඩ 2016 දෙසැම්බර් 31 දිනට භෞතික ඉලක්කයන්ගෙන් සියයට 69 ක් පමණක් නිමකර තිබුණු අතර එම ඉදිකිරීම් වැඩ 2018 අප්‍රේල් 30 දිනට නිමකර තිබුණි. තවද, බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සංරචකයේ 05 කොටස යටතේ වෙන්කරන ලද ඉදිකිරීම් වැඩ සඳහා උපදේශක සේවා කොන්ත්‍රාත්තුව, ඉදිකිරීම් වැඩ නිමකිරීමේ ප්‍රමාදයන් හේතුවෙන් අත්හැර දමා තිබුණි.

(ආ) ඉහත සඳහන් ඉදිකිරීම් වැඩ නතර කිරීම මත රු.මිලියන 485 ක්වූ ඉතිරිකිරීම් කැළණිය-වවුනියා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය හා ග්‍රාමීය විදුලිබල කටයුතු සඳහා ද්‍රව්‍ය හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම යටතේ ක්‍රියාත්මක කළ යුතු කාර්යයන් සඳහා උපයෝජනය කිරීමට සැලසුම් කර තිබුණි. 2014 නොවැම්බර් 12 දින ආරම්භ කරන ලද කැළණිය-වවුනියා වැඩිදියුණු කිරීම් ව්‍යාපෘතිය යටතේ කාර්යයන් නිමකර තිබුණු අතර ග්‍රිඩ් උපපොළ සඳහා 2016 මැයි 12 දින බලශක්තිය ලබාදෙන ලදී. කෙසේ වුවද, ප්‍රසම්පාදන ක්‍රියාවලිය යොදාගැනීමේ ප්‍රමාදයන් හේතුවෙන් ග්‍රාමීය විදුලිබල කටයුතු සඳහා ද්‍රව්‍ය හා උපකරණ ප්‍රසම්පාදනය කිරීම යටතේ කාර්යයන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි.

**3.3 මූල්‍ය පාලනය පිළිබඳ කරුණු**

**---------------------------------**

මුදල් රෙගුලාසි 133 හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ අවශ්‍ය පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.